# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு வர்த்தமானப் பத்திரிகை
## The Gazette of the Democratic Socialist Republic of Sri Lanka

අති විශෙෂ அதிவிசேஷமானது EXTRAORDINARY

අංක 1155 / 20 - 2000 ඔක්තෝබර් 27 වැනි සිකුරාදා - 2000.10.27

*1155 / 20 ஆம் இலக்கம் - 2000 ஆம் ஆண்டு ஒக்டோபர் மாதம் 27 ஆம் திகதி வெள்ளிக்கிழமை*

No. 1155 / 20 - FRIDAY, OCTOBER 27, 2000

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.) *(அரசாங்கத்தின் அதிகாரத்துடன் பிரசுரிக்கப்பட்டது)* (Published by Authority)


# I වැනි කොටස : (I) වැනි ජෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී. - බී. 21/78 IV.

### 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වන වගන්තිය සමඟ කියවිය යුතු 140 වන වගන්තිය යටතේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදන ලද නියමාවලිය.

සී. එස්. කරුණාරත්න,
ලේකම්,
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

2000 ඔක්තෝබර් මස 24 වන දින,
කොළඹ දී ය.

### නියමාවලිය

1. මේ නියමාවලිය 2000 අංක 4 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන (සංශෝධන) නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය ගැසට් පත්‍රයේ පළකරනු ලැබීමේ දී ක්‍රියාත්මක විය යුතු ය.

2. 2000 මැයි මස 23 වන දින අංක 1133/9 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ, 2000 අංක 1 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි (සංශෝධන) නියමාවලියෙන් අවසන් වරට සංශෝධිත 1980 අප්‍රේල් මස 10 වන දින අංක 83/7 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ 1980 අංක 1 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලිය පහත දැක්වෙන පරිදි මෙයින් වැඩි දුරටත් සංශෝධනය කරනු ලැබේ :

(1) එහි 14 වන ජේදයෙහි -

(i) ඒ ජේදයේ (1) වන අනුජේදයේ (ඇ) (i) අයිතමයේ "ප්‍රජා වෛද්‍ය විද්‍යා විශේෂඥ ක්ෂේත්‍ර හැර, පවුල් වෛද්‍ය විද්‍යාව සහ සාමාන්‍ය වෛද්‍ය වෘත්තීය- "යන වචන වෙනුවට "ප්‍රජා වෛද්‍ය විද්‍යාව, පවුල් වෛද්‍ය විද්‍යාව සහ සාමාන්‍ය වෛද්‍ය වෘත්තීය යන විශේෂඥ ක්ෂේත්‍ර හැර, විශේෂඥ ක්ෂේත්‍ර" යන වචන ආදේශ කිරීමෙන් ;

(ii) ඒ ඡේදයේ (1) වන අනුඡේදයේ (ඉ) අයිතමය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් ;

"(ඉ) පවුල් වෛද්‍ය විද්‍යාව සහ සාමාන්‍ය වෛද්‍ය වෘත්තීය හැර පහත දැක්වෙන අදාළ වෘත්තීය ආයතනයෙන් සාමාජිකයන් දෙදෙනෙක් ; එයින් – " ;

(iii) ඒ ඡේදයේ (2) වන අනුඡේදයේ (ඇ) (iii) වන අයිතමයේ "ප්‍රධාන අභ්‍යාස මධ්‍යස්ථානයෙන් සහ මහරගම පිළිකා ආයතනයෙන්" යන වචන වෙනුවට "ප්‍රධාන අභ්‍යාස මධ්‍යස්ථානය වන මහරගම පිළිකා ආයතනයෙන්" යන වචන ආදේශ කිරීමෙන් ;

(iv) ඒ ඡේදයේ (2) වන අනුඡේදයේ (ඇ) (iv) වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අයිතමය ඇතුළත් කිරීමෙන් –

"(ඈ) අදාළ වෘත්තීය ආයතනයෙන් සාමාජිකයන් දෙදෙනෙක්." ;

(v) ඒ ඡේදයේ (3) වැනි අනුඡේදයේ "මණ්ඩලය විසින් සහතික කරනු ලැබීමෙන් පසු හෝ මණ්ඩලය විසින් සහතික කරනු ලැබීම සඳහා වූ වරප්‍රසාදවලට සුදුසුකම් ලැබීමෙන් පසු හෝ" යන වචන වෙනුවට "මණ්ඩලය විසින් සහතික කරනු ලැබීමෙන් පසු අවුරුදු තුනක පළපුරුද්දක් ඇති තැනැත්තකු හෝ මණ්ඩලය විසින් සහතික කරනු ලැබීම සඳහා වූ වරප්‍රසාදවලට සුදුසුකම් ලබා ඇති තැනැත්තෙකු " යන වචන ආදේශ කිරීමෙන් ;

(vi) ඒ ඡේදයේ (3) වන අනුඡේදයේ අතුරු විධානය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන අතුරු විධානය ආදේශ කිරීමෙන් :–

"එසේ වුවද, (1) (ඇ) ඡේදයේ සහ (2) (ඇ) ඡේදයෙහි සඳහන් පුහුණු මධ්‍යස්ථාන නියෝජනය කරන නියෝජිතයන්, අවස්ථාවෝචිත පරිදි, සෞඛ්‍ය අමාත්‍යාංශයේ අදාළ විශේෂඥ ක්ෂේත්‍රයේ පුහුණු මධ්‍යස්ථානවල පුහුණුකරුවන් විසින් තෝරාගනු ලැබිය යුතු ය. තෝරාගනු ලැබූ තැනැත්තන්ගේ නම් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ ශ්‍රී ජයවර්ධනපුර රෝහලේ අධ්‍යක්ෂවරයා විසින්, අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය" ;

(vii) ඒ ඡේදයේ (3අ) වැනි අනුඡේදයේ (ඇ) (i) අයිතමය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් :–

"(1) සාමාජිකයන් තිදෙනෙකු ප්‍රධාන අභ්‍යාස මධ්‍යස්ථානය වන කොළඹ දන්ත වෛද්‍ය ආයතනයෙන් විය යුතුය ;

(2) එහි 25 වන ඡේදයෙහි "වෛද්‍ය විද්‍යාවේ විශේෂඥ ක්ෂේත්‍රය" යන්නෙහි අර්ථ කථනයෙහි සායනික "නියෝප්ලාස්ම වේදය" යන වචන වෙනුවට "සායනික නියෝප්ලාස්මවේදය" යන වචන ආදේශ කිරීමෙන්.